කො/දේවී බාලිකා විද්‍යාලය - කොළඹ

පළමු වාර පරීක්ෂණය - 2016 (මාර්තු)

# බුද්ධ ධර්මය - I

7 ශ්‍රේණිය — කාලය පැය 1 මිනිත්තු 30 යි

- එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් ප්‍රශ්න 20 සඳහා ලකුණු 40 ක් හිමි වේ.
- සුදුසු පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. බුදුරදුන් සත් සතිය ගත කිරීමේ දී සිව්වන සතිය ගතකළේ,
   i. අජපාල නුග රුක මුල ය
   ii. රුවන්ගෙහි ය
   iii. මිදෙල්ල ගස මුල ය
   iv. කිරිපලු නුග රුක මුල ය

02. සත් සතියේ දෙවන සතියෙහි සිදු වූ වැදගත් කරුණකි,
   i. අභිධර්මය මෙනෙහි කිරීම
   ii. ධර්මය ගුරු තනතුරෙහි තබා ගැනීම
   iii. අනිමිස ලෝචන පූජාව
   iv. සක්මන් කිරීම

03. යසකුල පුතු සමග පැවිදි වීමට පැමිණි මිතුරන් වූයේ
   i. වප්ප, භද්දිය, මහානාම, අස්සජි
   ii. ආනන්ද, භගු , කිම්බිල , දේවදත්ත
   iii. තපස්සු භල්ලුක වෙළඳ දෙබෑයන්
   iv. විමල , සුබාහු, පුණ්ණජි, ගවම්පති

04. උරුවෙල් දනව්වෙහි වාසය කළ නදී කාශ්‍යප යටතේ සිටි පිරිස
   i. තුන්සියයකි
   ii. පන්සියයකි
   iii. දහසකි
   iv. දෙසියකි

05. බුදුරජාණන් වහන්සේ කිඹුල්වත් නුවර බලා වැඩම කළේ,
   i. වෙසක් පුර පසළොස්වක පොහෝ දින ය
   ii. දුරුතු පුර පසළොස්වක පොහෝ දින ය
   iii. මැදින් පුර පසළොස්වක පොහෝ දින ය
   iv. නවම් පුර පසළොස්වක පොහෝ දින ය

06. බුදුරජාණන් වහන්සේ ගිලානෝපස්ථානයෙහි ඇති වැදගත්කම පැහැදිලි කරන ලද්දේ
   i. මහා වග්ග පාලියේ
   ii. චුල්ල වග්ග පාලියේ
   iii. පාරාජිකා පාලියේ
   iv. ධම්ම පදයේ

07. බුදුරජාණන් වහන්සේ ''අරහං'' ගුණයෙන් යුක්ත වීමට හේතුවක් ලෙස දැක්වෙන්නේ,
   i. තුන් කල්හි දන්නා බැවින්
   ii. රහසින්වත් පව් නොකළ බැවින්
   iii. සියලු කෙලෙස් නැසූ බැවින්
   iv. තුන්ලොවට මඟ පෙන්වූ බැවින්

4

08. බුදු රජාණන් වහන්සේ ''භගවා ලෙස හැඳින්වීමට හේතුව ලෙස දැක්වෙන්නේ

i. චතුරාර්ය සත්‍යය තමන් වහන්සේ විසින්ම අවබෝධ කර ගත් නිසා

ii. ලෞකික ලෝකෝත්තර සැප ලැබීමට හේතුවන කුසල් ඇති නිසා

iii. සසර කතරින් එතෙර වීමට තුන්ලෝකයට ම මඟ පෙන්වූ නිසා

iv. තුන්ලොව සතු මනා කොට දේශනා කළ නිසා

09. නිවසේ දී අනුගමනය කළ යුතු යහපත් පුරුද්දක් ලෙස දැක්වෙන්නේ

i. තම සිරුර ආවරණය වන පරිදි සුදුසු ඇඳුම් ඇඳීම

ii. කෙස්, නියපොතු කපා පිළිවෙළකට කොණ්ඩය පීරීම

iii. පිරිසිදු නිල ඇඳුමෙන් සැරසී සිටීම

iv. ගුරු දෙගුරුන්ට ආචාර දැක්වීම

10. විහාරස්ථානය තුළ වත් පිළිවෙත් සිදු කිරීමේ දී වැළකිය යුතු කරුණක් වන්නේ

i. බෝ මළුව ඇමදීම

ii. ත්‍රිවිධ චෛත්‍ය වන්දනා කිරීම

iii. උස් හඬින් ගාථා කීම

iv. පූජා භාණ්ඩ සුද්ධ පවිත්‍ර කිරීම

11. සිරිත් විරිත් නිවැරදි ව අනුගමනය කරන පුද්ගලයෙකු

i. ප්‍රසන්න පුද්ගලයෙකු වුව ද විවිධ රෝග වලට ගොදුරු වේ

ii. බොහෝ දෙනා ප්‍රශංසා කළ ද දුර්මත පැතිර යයි

iii. ජීවිතය සතුටින් ගත කළ ද ඇතැම් විට දුකට පත්වේ

iv. නීරෝගීමත් ප්‍රසන්න පුද්ගලයකු බවට පත්වේ.

The National e-learning Portal for The General Education

12. මෙත් වඩන නිවන් ප්‍රාර්ථනා කරන පුද්ගලයෙකු තුළ තිබිය යුතු උසස් ගුණාංගයකි

i. ඉවසීම

ii. දක්ෂවීම

iii. අතිමානී වීම

iv. කුලයන්හි ඇලීම

13. ''සබ්බේ සත්තා භවන්තු සුඛී සත්තා භවන්තු සුඛී සත්තා'' යන පාඨයෙහි අදහස වන්නේ,

i. සියලු සත්වයෝ සුඛිත මුදිත වෙත් වා

ii. සියලු සත්වයන්ට මෙත් පැතිරේ වා

iii. සියලු සත්වයෝ සැපවත් වෙත් වා

iv. සියලු සත්වයෝ දුකින් මිදෙත් වා

14. මෙත් වැඩීමේ නිවැරදි ඉරියව්වක් නො වන්නේ පහත සඳහන් කරුණු අතරින්,

i. නිදාගෙන භාවනා කිරීම

ii. සිටගෙන භාවනා කිරීම

iii. සක්මන් කරමින් භාවනා කිරීම

iv. හිඳගෙන භාවනා කිරීම

15. සුදත්ත සිටුවරයා අනේපිඬු සිටුවරයා ලෙස හැඳින්වූයේ

i. තමා සතු සියල්ල අනාථයින්ට පරිත්‍යාග කළ නිසා

ii. කාරුණික හදවතින් අනාථයින්ට පිහිට වූ නිසා

iii. හැකි සෑම අවස්ථාවක ම අසරණයන්ට පිහිට වූ නිසා

iv. අනාථයින් උදෙසා ආහාර පාන පරිත්‍යාග කළ නිසා

16. අනේපිඩු සිටුතුමා සඟ සතු කොට පූජා කළ ආරාමය

i. නිග්‍රෝධාරාමය
ii. පූර්වාරාමය
iii. ජේතවනාරාමය
iv. වේළුවනාරාමය

17. විශාඛා සිටු දියණියට පිය රජු විසින් ලබාදුන් අවවාදයන්ට අයත් නො වන්නකි

i. දෙන්නන් හටත් නො දෙන්නන් හටත් නොදිය යුතු ය.
ii. දෙන්නන් හටත් නො දෙන්නන් හටත් දිය යුතු ය
iii. දෙන්නන් හට දිය යුතු ය
iv. නොදෙන්නන් හට දිය යුතු ය

18. විශාඛා සිටු දියණියගේ චරිතයෙන් අපට ලබාගත හැකි ආදර්ශයක් වන්නේ

i. මෙලොව පරලොව ජීවිතය සරු කර ගැනීමට කටයුතු කිරීම යි
ii. ශාසනික අභිවෘද්ධිය උදෙසා කටයුතු නො කිරීම යි
iii. මෙලොව දියුණුව ගැන පමණක් සිතා කටයුතු කිරීම යි
iv. සමාජය ගොඩ නගන්නට දායක නො වීම යි

19. ධම්ම පදයට අයත් වග්ග හා ගාථා ප්‍රමාණය නිවැරදි ව දැක්වෙන්නේ

i. 26 හා 424
ii. 23 හා 423
iii. 26 හා 423
iv. 23 හා 425

20. බෞද්ධයාගේ අත්පොත වන ධම්ම පදය අයත් වන පිටකය හා නිකාය නිවැරදිව ඇතුළත් වන්නේ

i. විනය පිටකයේ ඛුද්දක නිකායට
ii. සූත්‍ර පිටකයේ ඛුද්දක නිකායට
iii. අභිධර්ම පිටකයේ ඛුද්දක නිකායට
iv. සූත්‍ර පිටකයේ අංගුත්තර නිකායට

The National e-learning Portal for The General Education

## 2 - කොටස

- ප්‍රශ්න 06 ක් තෝරාගෙන පිළිතුරු සපයන්න.

01)

i. බුද්ධත්වයෙන් පළමු වසර තුළ සිදු වූ සුවිශේෂී සිදුවීම් දෙකක් ලියන්න.
ii. බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම ශ්‍රාවකයන් වහන්සේලා හැට නම නම් කරන්න.
iii. බුද්ධත්වයෙන් පළමු වසර ගත කිරීම තුළින් අපගේ ජීවිතයට ලබාගත හැකි ආදර්ශ 5 ක් ලියන්න.

02)

i. බුදුරජාණන් වහන්සේගේ අසරණ සරණ ගුණය සඳහා උදාහරණ දෙකක් ලියන්න.
ii. පාසල් ශිෂ්‍යයෙකු වශයෙන් ඔබට අසරණයන්ට පිහිට විය හැකි අවස්ථා දෙකක් ලියන්න.
iii. රෝගීන්ට උපකාර කිරීමේ දී උපස්ථායකයෙකු තුළ තිබිය යුතු ගුණාංග 05 ක් ලියන්න.

03)

i. බුදුගුණ මෙනෙහි කිරීමෙන් බෞද්ධයන්ට ලැබෙන උසස් ප්‍රතිඵල 02 ක් ලියන්න.
ii. "බඹ සුර යකුන් නඳ " යන කවිය සම්පූර්ණ කරන්න.

iii. "සත්ථා දේව මනුස්සානං" යන බුදු ගුණය කෙටියෙන් හඳුන්වන්න.

04)

i. සිරිත් හා විරිත් යන වචන දෙකෙහි අරුත් ලියන්න.

ii. සිරිත් විරිත් අනුගමනය තුළින් අත්වන ප්‍රයෝජන 03 ක් ලියන්න.

iii. ආදර්ශවත් සිසුවෙකු වීමට පාසලේ දී අනුගමනය කළ යුතු සිරිත් විරිත් 05 ක් ලියන්න.

05)

i. මෛත්‍රී භාවනාව වැඩිය යුතු ආකාරය පැහැදිලි කරන සූත්‍ර දේශනාව කුමක් ද ?

ii. මෛත්‍රී භාවනාව වැඩීමේ ආනිසංස 03 ක් ලියන්න

iii. මෛත්‍රී භාවනාව වැඩීම යහපත් සමාජයක් ගොඩනැගීමට ඉවහල් වන අන්දම කෙටියෙන් ලියන්න.

06)

i. අනේපිඬු සිටුතුමාගේ දියණිවරුන් දෙදෙනෙකු නම් කරන්න

ii. ජේතවනාරාමයට එම නම තැබීමට හේතුව කෙටියෙන් ලියන්න.

iii. අනේපිඬු සිටු හා විශාඛා සිටු දියණියගේ චරිතවලින් ලබාගතහැකි ආදර්ශ 03 බැගින් ලියන්න.

07)

i. අනුසෝතගාමී හා පටිසෝතගාමී යන පද හඳුන්වන්න.

ii. "අසවලා මට බැන්නේය. ගැසුවේය. පැරදවූයේය. මා සතු දේ පැහැර ගත්තේ යැයි නිතරම මෙනෙහි කරන්නන්ගේ වෛරය නොසන්සිඳේ. එසේ නොකරන්නාගේ වෛරය සන්සිඳේ." යන අදහස ඇතුළත් ගාථාව ලියන්න.

iii. ඔබ ඉගෙන ගත් ධම්ම පද ගාථා ඇසුරින් ළමා ජීවිතයට අදාළ කරගත හැකි ආදර්ශ පාඨ 05 ක් ලියන්න.

The National e-learning Portal for The General Education